**COVID 19 සෞඛ්‍ය හා සමාජ ආරක්ෂණ අරමුදල - 2020**

-----------------------------------------------------------------

**1. මූල්‍ය ප්‍රකාශන**

---------------

**1.1 මතය**

-------

COVID 19 සෞඛ්‍ය හා සමාජ ආරක්ෂණ අරමුදලේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය, ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(3) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

අරමුදලේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 මතය සඳහා පදනම**

----------------------

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්**

-----------------------------------------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, අරමුදල අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය අරමුදල ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා අරමුදලේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.
අරමුදලේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරික්ෂා කිරීමේ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, අරමුදලේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

-----------------------------------------------------------------------

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් අරමුදලේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ අරමුදලේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ අරමුදලේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, අරමුදල ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

**1.5 නීති, රීති, රෙගුලාසි, කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම**
--------------------------------------------------------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | 2020 අගෝස්තු 29 දිනැති අංක 01/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය | ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 149 ව්‍යවස්ථාව අනුව, විසර්ජන පනතින් අනුමත කෙරෙන අයවැයට පරිබාහිරව ආදායම් රැස් කිරීම හා වියදම් දැරීම අනුමත නොවූවත් පාර්ලිමේන්තු අනුමැතියකින් තොරව 2020 අප්‍රේල් 16 දින ආරම්භ කර තිබූ මෙම අරමුදල සඳහා චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව එදින සිට වර්ෂයක් ඇතුළත ලබාගත යුතු පාර්ලිමේන්තු අනුමැතිය විගණිත දිනය වූ 2021 ඔක්තෝබර් 08 දින වන විටත් ලබාගෙන නොතිබුණි. | අරමුදල පිහිටුවන අවස්ථාව වන විට පාර්ලිමේන්තුව විසුරුවා හැර තිබුණු බැවින් 2020 අගෝස්තු 29 දිනැති අංක 01/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව එම අවස්ථාවේදී පාර්ලිමේන්තු අනුමැතිය ලබා ගැනීමට නොහැකි වී ඇත. අදාල අනුමැතිය ලබා ගැනීමට ඉදිරියේදී කටයුතු කරනු ඇත. | පාර්ලිමේන්තු අනුමැතිය ලබාගැනීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | | | |
| | (i) මුදල් රෙගුලාසි 168(1) | වෙනයම් ආකාරයකට විධිවිධාන සලසා ඇති අවස්ථා හැර අන්‍ය අවස්ථාවලදී ඕනෑම නිලධාරියකුට රජය වෙනුවෙන් මුදලක් ලැබුනු විට, ඔහු විසින් | කොවිඩ් 19 -සෞඛ්‍ය හා සමාජ ආරක්ෂණ අරමුදලට සිදු කරන ලද පරිත්‍යාග වලින් සුලු ප්‍රමාණයක් හැර ඉතිරි | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| | | මු.රෙ. 169 විධිවිධානවලට යටත්ව, නියමිත ආකෘති පත්‍රයෙහි යන්ත්‍රානුසාරයෙන් අංක කරන ලද කාර්යාලීය කුවිතාන්සියක් වහාම නිකුත් කළ යුතුයි. එසේ වුවද, 2020 වර්ෂයේ අප්‍රේල් මාසයේ සිට සැප්තැම්බර් මාසය දක්වා එකතුව වූ රු. 114,073,730 කට අදාල 172 පොදු ආකෘති පත්‍ර ප්‍රකාරව ලියන ලද කුවිතාන්සි 102 ක් විගණන දිනය වූ 2021 ජුලි 26 දින වන විටත්, අදාළ මුදල තැන්පත් කළ ආයතනය හෝ පුද්ගලයන් වෙත නිකුත් කිරීමට කටයුතු කර නොතිබුණි. | සියළුම පරිත්‍යාගයන් සිදු කර ඇත්තේ සෘජුවම අරමුදලේ නිල බැංකු ගිණුම වෙතය . පරිත්‍යාගවල වටිනාකම අනුව රු. 10 සිට රු. මිලියන 50 ක් පමණ දක්වා වූ පරාසයකට මෙම දායකවීම් විහිද යයි . මෙම තත්ත්වය නිසා පුද්ගල හා ආයතන වශයෙන් පරිත්‍යාගශීලීන්ගේ සංඛ්‍යාත්මක අගය ඉහළ ගොස් ඇත.<br><br>ප්‍රායෝගික වශයෙන් වඩාත් සුදුසුම පියවර ලෙස ජනාධිපති කාර්යාල වෙත සිදු කරන ලද සෘජු පරිත්‍යාගයන්ට අමතරව වැඩි වටිනාකමක් ඇති පරිත්‍යාගයන් සඳහා පොදු 172 කුවිතාන්සි නිකුත් කිරීමට සූදානම් කරන ලද අතර, ඔවුන්ගේ ලිපිනයන් හා අනන්‍යතාවය පිළිබඳ තොරතුරු සොයාගත් පසු කුවිතාන්සි ඔවුන් වෙත ලබා දීමට තීරණය කරන ලදී .<br><br>ඒ අනුව මේ වන විට අනන්‍යතාවය තහවුරු කරගත් පරිත්‍යාගයන් වැඩි ප්‍රමාණයකට කුවිතාන්සි නිකුත් කිරීමට කටයුතු කර ඇත. | |
| (ii) | මුදල් රෙගුලාසි 185(1) | මුදල් භාර ගැනීමේ නිලධාරියකුට ලැබෙන සියළුම මුදල් ප්‍රමාණයන් මුදල් පොතේද ඒ සඳහා නියමිත වෙනත් පොත්වලද නිසි පරිදි | එක් දිනක් තුල අරමුදලේ නිල බැංකු ගිණුම වෙත පරිත්‍යාගශීලීන් විශාල | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| | | සටහන් කළ යුතු වුවද, ඍජු තැන්පතු ලෙසින් දිනකදී ලැබෙන සියලුම තැන්පතු එකතුව පමණක් මුදල් පොතේ සටහන් කර තිබූ අවස්ථා විය. | ප්‍රමාණයක් ඍජු තැන්පතු ලෙස පරිත්‍යාග සිදු කර තිබුණු අතර, එම පරිත්‍යාගශීලීන්ගේ අනන්‍යතාවය හඳුනාගැනීමට නොහැකි බැවින් එවැනි ඍජු පරිත්‍යාග හා අනන්‍යතාවය හෙළි කිරීමට නොකැමැති පරිත්‍යාගශීලීන් වෙනුවෙන් දිනක ලැබීම් එකතුවක් ලෙස ප්‍රධාන ගණන්දීමේ නිලධාරී නමින් කුවිතාන්සියක් නිකුත් කර ලැබීම් ලෙස සටහන් කර ඇත.<br><br>එම ලැබීම් එකතුවේ විස්තරාත්මක තොරතුරු අරමුදලේ බැංකු ගිණුම් ප්‍රකාශයේ සටහන් සමඟ තහවුරු වන බව ද සඳහන් කරමි. | |
| (iii) | මුදල් රෙගුලාසි 185 (2) | මුදල් භාර ගැනීමේදී, මුදල් පොතේ සටහන්වල දිනය හා මුදල් භාරගැනීමේ නිලධාරියා නිකුත් කරනු ලබන කුවිතාන්සිවල දිනය සමාන විය යුතුයි. එසේ වුවද, මුදල් පොත අනුව දිනය සහ කුවිතාන්සියේ දිනය අතර වෙනස්කම් පැවති අවස්ථා 03ක් නිරීක්ෂණය විය. | සඳහන් කර ඇති අවස්ථා තුනේදී මුදල්පොතේ සටහන් තැබීම බැංකු ප්‍රකාශ උපයෝගී කරගෙන සිදු කර ඇති බැවින් දාතමයන්හි වෙනස සිදුවී ඇති අතර, මේ වන විට එම සටහන් කිරීම් නිසි පරිදි සිදු කරනු ලැබේ. කෙසේ වෙතත් කුවිතාන්සි නිකුත් කර ඇති සියළුම ලැබීම් මුදල් පොතේ ඇතුලත් කර ඇත. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු. 1,672,798,912 ක අතිරික්තයක් වූ අතර අරමුදල සමාලෝචිත වර්ෂයේ ස්ථාපිත කර ඇති බැවින් ඊට අනුරූප ඉකුත් වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵල සමඟ සැසදීමක් සිදු කළ නොහැකි විය.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ ක්‍රියාකාරකම්

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2020 මැයි 15 දිනැති කළමනාකරණ කමිටු තීරණය ප්‍රකාරව අරමුදලට ලැබෙන පරිත්‍යාග, බදු මුදලින් නිදහස් කරගැනීමට කටයුතු කිරීම සඳහා තීරණය කර තිබුණද, 2021 නොවැම්බර් 30 දින වන විටත් අරමුදලට ලැබෙන පරිත්‍යාග බදු මුදලින් නිදහස් කර ගැනීමට කටයුතු කර නොතිබුණි. | පාර්ලිමේන්තු අනුමැතියට ඉදිරිපත් කිරීමට සමගාමීව පරිත්‍යාග බදු මුදලින් නිදහස් කර ගැනීමට හැකි වනු ඇත. | කළමනාකරණ කමිටු තීරණ ක්‍රියාත්මක කිරීම කළ යුතුය |
| (ආ) | අරමුදලින් යාපනය විශ්වවිද්‍යාලයේ PCR පරීක්ෂණාගාරය සඳහා අවශ්‍ය හදිසි මිලදී ගැනීම් වෙනුවෙන් රු. මිලියන 2.50 ක් ලබාදී තිබුණි. ඉන් සියයට 80 ක් හෙවත් රු. මිලියන 2.01 ක් වූ වියදම්, ඇස්තමේන්තුවෙන් පරිබාහිර වියදම් සඳහා වැය කර තිබූ අතර, එම වියදම් අතරින් රු. මිලියන 1.26 ක් PCR පරීක්ෂක සහායකුට දීමනා ලෙස ගෙවා තිබුණි. | අරමුදලෙන් මුදල් ලබා දීමට පෙර මෙම PCR පරීක්ෂණාගාරය ක්‍රියාකාරී තත්ත්වයට පත් කර ගැනීමට සිදු වී ඇති බැවින්, වෙනත් ආකාරයකින් මුදල් යොදවා මූලික කටයුතු අවසන් කර ඇත .<br><br>මේ හේතුවෙන් කොවිඩ් 19 සෞඛ්‍ය හා සමාජ ආරක්ෂණ අරමුදලෙන් ලබා දෙන ලද මුදල් මුල් ඇස්තමේන්තුවෙන් බැහැර වුවද, PCR පරීක්ෂණාගාරය සම්බන්ධ අනෙකුත් කටයුතු වලටම යොදවා ඇත. | වියදම් ඇස්තමේන්තු නිවැරදිව ලබාගැනීම කළ යුතුය. |

## 3.2 අරමුදල් කළමනාකරණය

**විගණන නිරීක්ෂණය**

COVID 19 සෞඛ්‍ය හා සමාජ ආරක්ෂණ අරමුදල මඟින් පහත සඳහන් අරමුණු ඉටු කළ යුතුව තිබුණි.

- ඖෂධ, ඖෂධ පරීක්ෂණ උපකරණ ඇතුලු සෞඛ්‍ය සේවා පහසුකම් සඳහා සහ COVID 19 වසංගතයට එරෙහිව සටන් කිරීමට ඇති ධාරිතාවය නඟාසිටුවීමට හදිසි මූල්‍ය අවශ්‍යතා ලබාදීම.
- සෞඛ්‍ය සේවා, සෞඛ්‍ය සේවා නිලධාරින්ගේ සහ අත්‍යාවශ්‍ය පොදු සේවා සපයන්නන්ගේ සෞඛ්‍ය ආරක්ෂාව සඳහා වියදම් දැරීම.
- ළමයින්, කාන්තාවන්, අඩු ආදායම් ලබන පුද්ගලයින්, වයස්ගත, ආබාධිත සහ අවදානම් පුද්ගලයින් සඳහා මූලික අවශ්‍යතා සැලසීම.
- ගම්බද සහ දුරස්ථ බෙහෙත් ශාලා සඳහා මූල්‍ය පහසුකම් ලබාදෙමින් පොදු සෞඛ්‍ය අංශය ශක්තිමත් කිරීම.
- දේශීය අමුද්‍රව්‍ය, සම්පත්, දැනුම සහ නිපුණතා උපයෝගී කරගනිමින් සනීපාරක්ෂක නිෂ්පාදන, නිෂ්පාදනය සහ බෙදාහැරීම සඳහා දේශීය වෛද්‍ය ඒකකවලට උපකාර කිරීම.
- උසස් ගණයේ ආරක්ෂිත ඇඳුම් සහ සනීපාරක්ෂක නිෂ්පාදන ගෝලීය වෙළඳපලට සැපයීමට නවෝත්පාදන සහ පරීක්ෂණ ප්‍රවර්ධනය කිරීම.

2020 දෙසැම්බර් 31 දිනට එකතුව රු. මිලියන 1,641.73 ක් වූ අරමුදලේ ශේෂය, ඉහත කී අරමුණු සඳහා උපයෝජනය නොකර බැංකු ජංගම ගිණුමේ රු. මිලියන 6.25 ක් හා ඉතිරි කිරීමේ ගිණුමේ රු. මිලියන 111.06 ක් ලෙස මුදල් රඳවාගෙන තිබූ අතර ස්ථාවර තැන්පතුවල රු.මිලියන 1,524.42 ක් ආයෝජනය කර තිබුණි.

**කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම**

කොවිඩ් 19 සෞඛ්‍ය හා සමාජ ආරක්ෂණ අරමුදලේ අරමුණු යටතේ මූල්‍ය ප්‍රතිපාදන ලබා දීමට හැකි ව්‍යාපෘති සම්බන්ධයෙන් කළමනාකරණ කමිටුව වෙත ලැබෙන යෝජනා සැලකිල්ට ගෙන මුදල් නිදහස් කරනු ලබන අතර , කොවිඩ් වසංගත තත්ත්වය හේතුවෙන් බොහොමයක් ව්‍යාපෘති දෙස්, විදෙස් ආධාර යටතේ ක්‍රියාත්මක වූ බැවින් අරමුදල් යෙදවීමට ප්‍රමාණවත් ව්‍යාපෘති යෝජනා කළමනාකරණ කමිටුව වෙත ලැබී නොමැත. ඒ අනුව අරමුදලේ මූල්‍ය වත්කම් වසංගත තත්ත්වයේ හැසිරීම අනුව ක්ෂණිකව උපයෝජනය කර ගැනීමට මෙන්ම නිශ්ක්‍රීය ලෙස මුදල් තබාගැනීම සුදුසු නොවන බව නිරීක්ෂණය වූ බැවින්, දින 07, දින 31, මාස 03, මාස 06 හා වසර 01 ක් වශයෙන් ස්ථාවර තැන්පතුවල තැන්පත් කිරීමට කටයුතු කර ඇත. එමගින් අරමුදලේ මූල්‍ය වත්කම් වැඩිකර ගැනීමට හැකි වී ඇත.

**නිර්දේශය**

අරමුදලේ මුදල් උපරිම වශයෙන් උපයෝජනය කිරීමට කටයුතු කළ යුතුය.